## ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

## තනතුරු පුරප්පාඩු

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පහත තනතුරු සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | තනතුර | : **පර්යේෂණ විශ්ලේෂක (පුරප්පාඩු 02)** |
| | **මාසික දීමනාව** | : **මූලික වැටුප රු.53,150.00 + ජීවන වියදම් දීමනාව රු.7,800.00 = රු. 60,950.00** |
| | **අධ්‍යාපන සුදුසුකම්** | : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/ සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ ආරක්ෂක අධ්‍යයනය/ බුද්ධි සේවා අධ්‍යයනය/ ත්‍රස්තවාදය/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ නීතිය/ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| | **පළපුරුද්ද** | : පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් සහිත වීම. |
| | **වයස** | : අවු. 21ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි. |
| 02. | තනතුර | : **පර්යේෂණ සහකාර (පුරප්පාඩු 03)** |
| | **මාසික දීමනාව** | : **මූලික වැටුප රු.32,200.00 + ජීවන වියදම් දීමනාව රු.7,800.00 = රු. 40,000.00** |
| | **අධ්‍යාපන සුදුසුකම්** | : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/ සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ ආරක්ෂක අධ්‍යයනය/ බුද්ධි සේවා අධ්‍යයනය/ ත්‍රස්තවාදය/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ නීතිය/ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම. |
| | **පළපුරුද්ද** | : තනතුරට අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබාතිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |
| | **වයස** | : අවු. 18ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි. |

- **බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- ඉහත තනතුරු වලට අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත් **2023.01.15** දිනට හෝ ඊට ප්‍රථම **ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක / පර්යේෂණ සහකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

වැඩිදුර විස්තර සඳහා **www.defence.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ.**